# හා පවුල



සහේළි සාවිදයා දීගල

ග්‍රන්ථ නාමය :- හා පවුල

කතාව පිටකවරය හා චිත්‍ර :- සහේළි සාවිද්‍යා දීගල

ISBN අංකය :- 978-624-206-938-8

මෙම කෘතියෙහි සියලුම අයිතිය කතෘ සතුය..

කතෘගේ වෙනත් කෘති : අපි හොඳම යාළුවෝ

ප්‍රකාශය හා පළමු මුද්‍රණය : 2023 දෙසැම්බර් 22

# <u>පිදුම</u>

මාගේ ලේඛන කුසලතාව වර්ධනය කර ගැනීම සඳහා මඟ පෙන්වූ මහාමායා විදුහලේ 4-C පන්තියේ ප්‍රියන්ති ජයසේකර ගුරු මෑණියන්ට හා ග්‍රන්ථය නිමා කර ගැනීමට සහාය දුන් සියළුම දෙනාටත් සැකසූ මෙම ග්‍රන්ථය පිළිගන්වමි.

ඩී.එම්. සහේළි සාවිද්‍යා දීගල

4 ශ්‍රේණිය C

මහාමායා බාලිකා විදුහල, මහනුවර

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැඟීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර

2023.10.20

එකෝමත් එක කැලෑවක හා පවුලක් ජීවත් වුණා. ඒ හා පවුලේ හැමෝම උත්සහවන්තයි. ඒ හා පවුලේ හිටියේ හතර දෙනයි. ඒ හතර දෙනා තමයි හා තාත්තායි, හා අම්මායි, හා අක්කායි , හා අයියායි. ඒගොල්ලෝ ජීවත් වුනේ හරිම සතුටින්. ඒ කැලෑවට හොඳට වහිනවා. වහින නිසා ගංඟා, ඇළ දොළවල් හොඳට පිරිලා. ඒවගේම ගස්වල මල් පිපෙනවා , පලතුරු හැදෙනවා. ටික කාලයක් යනකොට වැස්ස සතියකින් විතරයි වහින්නේ. හා පවුලට ඉස්සරහට ලොකු වෙනසක් වෙයි කියලා හිතුවා. ඒ නිසා වතුර එකතු කළා , කෑම එකතු කළා.



ටික දවසක් යනකොට මේ කලෑවට නියඟයක් ආවා. ගස් වේළුනා, මල් පරවුණා, පලතුරු හට ගත්තේ නෑ මල් පරවුණු නිසා. ඒ වගේද ගංගා ඇළ දොළවල වතුර නැති වුණා. සත්තු මැරුණා. ලස්සනට තිබුණු කැලේ කැත වුණා. හා පවුල තීරණය කළා වෙනත් කැලයකට යන්න. ඒ හා පවුල විතරක් නෙවෙයි කැලේ හැම සතෙක්ම එක් රැස් කරලා ඒ හැමෝටම කතා කරලා කිව්වා , "අපි මේ කැලෙන් යමු" කියලා. සත්තු කිවුවා "කෑමයි , වතුරයි අපි ළඟ ඉතුරු වෙලා තියෙනවා . අපි ඒ කෑම බීම ටික බෙදා හදා ගමු . ඔයාලා එකඟ ද යාළුවනේ". "හා අපි එකඟයි. අපි ළඟත් කෑම ඉතුරු වෙලා තියෙනවා."



“හරි අපි ඒවා බෙදා හදාගෙන කමු. හරි දැන් ඔයගොල්ලෝ ගිහින් කෑම ඉතුරු වුණ දේවල් තම තමන්ට ඕන බඩු ගන්න. හරි අපි යනවා. පොඩ්ඩක් ඉන්න බඩුත් අරන් මෙතෙන්ටම එන්න. ඊට කලින් කියන්න බලන්න හොඳ කැලෑවක් ” හා අම්මා ඇහුවා. “ මම දන්නවා හොඳ කැලෑවක් ” මුව හාමි කිව්වා. “කියන්න බලන්න මුව හාමි..”. “මේ කැලෑවෙත් මිනිස්සු නැති ගමක් තියෙනවා, ඒ ගමෙන් එපිට කැලෑවක් තියෙනවා. ඒ කැලෑව ලස්සනයි.”



“හා එහෙනන් ගිහින් ආපහු එන්න”. “හරි අපි එන්නම්”.  ඔන්න ඉතින් දුවේ , පුතේ මේ කැලෑ යාළුවෝ පොරොන්දු වුණ තැනට ආවා. ඔන්න මේ කැලෑ යාළුවෝ ගමන පිටත් වුණා. ඔහොම ටික දුරක් යන කොට මිනිස්සු අතෑරලා තිබුණු  ගමක් හම්බ වුණා. කැලෑ යාළුවෝ කථා වුණා දැන් රෑ වෙන්න ළඟයි. ඉතින් අපි මේ ගමේ අදට ඉඳලා හෙට උදේට ගමන යන්න පිටත් වෙමු. ඉතින් කැලෑ යාළුවෝ උයලා පිහලා කෑවා. ඊට පස්සේ නිදා ගන්න ගියා.



ඔන්න ඔහොම ඉද්දී නරි හාමිනේ හිටපු තැනට අර නයා ආවා. නරි හාමිනේට ඇහැරිලා , එක පාරටම නයාව දැක්කා. නරි හාමිනේ ගම දෙදරන්න තරම් හයියෙන් කෑ ගැහුවා. මෙන්න මේ විදිහට තමා නරි හාමිනේ කෑ ගැහුවේ, “ අම්මෝ මාව බේර ගනියෝ ..මෙන්න නයෙක් ..” ළඟ හිටපු නයා නරි හාමිනේගේ කෑ ගැහිල්ල නිසා එකපාරට ගැස්සුනා. නයාට කෑ ගැහිල්ල ඉවසගන්න බැරි නිසා නරි හාමි ළඟට කිට්ටු වුණා. නරි හාමිනේට ක්ලාන්තේ හැදුණා. කැලෑ සත්තු දුවගෙන ඇවිල්ලා නයාව එළවලා දැම්මා.

නරි මහත්තයා තමන්ගේ හාමිනේට වතුර ටිකක් අරගෙන මූණට ඉස්සා. නරි හාමිනේ ඇස් දෙක ඇරලා බැලුවා. නරි හාමිනේ, නරි මහත්තයාට කිවුවා “මට හරි බයයි මෙතන නයෙක් ඉන්නවා”. “ නෑ.. නෑ.. අපි නයාව එලෙවුවා , බය වෙන්න එපා”. ඒක මිසක්... ඔන්න උදේ වුණා. කුකුළා හැඬලුවා. කැලෑ සත්තු උයාගෙන කාලා බඩු මුට්ටු අහුරා ගත්තා. කැලෑ සත්තු ආයෙත් ගමන පටන් ගත්තා.



හා පවුල දැන ගත්තා දැන් විස කටු තියෙන ගස් තියෙන බව. හා පවුල කැලෑ සත්තු ටික ළඟට එන්න කියලා මෙහෙම කිවුවා. “දැන් ඊළඟට අපට හම්බවෙන්නේ, විස කටු තියෙන කැලයක්. ඒක නිසා තම තමන්ගේ දරුවන් තම තමන් ළඟ තියා ගන්න. නැත්නම් ඒගොල්ලෝ අතරමං වෙයි”. දැන් මේ කැලෑ සත්තු ඒ කැලය පහු කරගෙන ගිහින් ඉවරයි . දැන් මේගොල්ලෝ  අපහසුතාවලින් ජය අරන් අර කැලයට ගියා. කැලෑ සත්තු ටික සතුටින් ජීවත් වුණා.

දැක්කා නේද පුංචි ඔයාලා… සත්තුන්ගේ වුණත් තියෙන උත්සහවන්තකම.

**උත්සහවන්තයා  කෙදිනක හෝ ජය ගනී.**





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ  දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී  ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20